# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1720/37 - 2011 අගෝස්තු 25 වැනි බ්‍රහස්පතින්දා - 2011.08.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත

2 වැනි වගන්තිය යටතේ නියමයන්

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ, බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති හා නාගරික සංවර්ධන අධිකාරියේ විෂයභාර අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් කොටස්, ඇහැලියගොඩ නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් වෙනුවෙන්, නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීමට වහා අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම් කොටස් අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2011 ජුලි මස 27 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇහැලියගොඩ ගමේ පිහිටියාවූ ද, බලයලත් මිනින්දෝරු හා තලමිතිකරු අනිල් නවගමුව මහතා විසින් මැන පිළියෙල කරන ලද අංක 4285/B හා 2011.03.07 දිනැති සැලසුමේ කැබලි අංක 1, 2 හා 3 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 18.3133ක් (අක්කර 45, රූඩ් 1, පර්චස් 0.5) විශාල ඉඩම් කොටස්,

මායිම් පහත පරිදි වේ.

කැබලි අංක 1 - විශාලත්වයෙන් හෙක්ටයාර් 0.7692 (අක්. 1, රූ. 3, පර්. 24.10) ක් වූ හත්ලහ පහළ මීටුවල, හොරගොඩ කුඹුර, මල්ගොමුව, මහනාරං කුඹුර, වැලීලියද්ද, පිංකුඹුර, කොරවක් කුඹුර සහ ඕට්ටගේ කුඹුර

උතුරට : හොරගොඩ පාර ;
නැගෙනහිරට : එච්. ප්‍රේමදාස සහ තවත් අයට අයත් ඉඩම ;
දකුණට : සැලැස්මේ කැබලි අංක 2 හා 3 ;
බටහිරට : සැලැස්මේ කැබලි අංක 3.

1A - G 14992— 340 (2011/08)

කැබලි අංක 2 - විශාලත්වයෙන් හෙක්ටයාර් 7.6422 (අක්. 18, රූ. 3, පර්. 21.5) ක් වූ හත්ලහ පහළ මීටුවල, හොරගොඩ කුඹුර, මල්ගොමුව, මහනාරං කුඹුර, වැලිලියද්ද, පිංකුඹුර, කොරවක් කුඹුර සහ ඕට්ටගේ කුඹුර

| | | |
|---|---|---|
| උතුරට | : | සැලැස්මේ කැබලි අංක 1 ; |
| නැගෙනහිරට | : | එච්. ප්‍රේමදාස, පී. ගුණදාස, නිමල් විජේනායක, ආර්. පී. ඒ. ආරියදාස, මුත්තු මාරියම්මන් කෝවිලට හා තවත් අයට අයත් ඉඩම් ; |
| දකුණට | : | ශ්‍රී මාරියම්මන් කෝවිල හා කොළඹ රත්නපුර ප්‍රධාන පාර ; |
| බටහිරට | : | සැලැස්මේ කැබලි අංක 3 හා 1. |

කැබලි අංක 3 - විශාලත්වයෙන් හෙක්ටයාර් 9.9019 (අක්. 24, රූ. 1, පර්. 34.9) ක් වූ හත්ලහ පහළ මීටුවල, හොරගොඩ කුඹුර, මල්ගොමුව, මහනාරං කුඹුර, වැලිලියද්ද, පිංකුඹුර, කොරවක් කුඹුර සහ ඕට්ටගේ කුඹුර

| | | |
|---|---|---|
| උතුරට | : | හොරගොඩ පාර හා සැලැස්මේ කැබලි අංක 1 ; |
| නැගෙනහිරට | : | සැලැස්මේ කැබලි අංක 2 ; |
| දකුණට | : | කොළඹ රත්නපුර ප්‍රධාන පාර සහ පී. කුලරත්න සහ තවත් අයට අයත් ඉඩම ; |
| බටහිරට | : | කොළඹ රත්නපුර ප්‍රධාන පාර සහ නූර් නසීම් හා තවත් අයට අයත් ඉඩම. |

09-303

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.